www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුරෝපීය මැතිවරනය 2009
# බර්ලින් රැස්වීම සසප මැතිවරන ව්‍යාපාරය අවසන් කරයි

**European elections 2009**
**Berlin meeting concludes SEP election campaign**

අපේ වාර්තාකරුවන් විසිනි
2009 ජුනි 10

''මැතිවරනය තුල අපගේ මැදිහත් වීමේ අරමුන වන්නේ සංස්ථාපිත පක්ෂවලින් ස්වාධීනව දේශපාලනික සිද්ධීන්හි මැදිහත්වීමට යුරෝපයේ වැඩ කරන ජනතාවට ඉඩ ලබාදෙන නව පක්ෂයක් ගොඩ නැංවීමයි. මහා සංගතවල ලාභ අපේක්ෂාවලට පෙර සමාජ අවශ්‍යතා තබන සමාජවාදී සමාජයක් සඳහා අපි සටන් කරමු. විශාල ව්‍යාපාරවල බැංකුවල මෙවලමකට වඩා කිසිත් අඩුනැති යුරෝපා සංගමයට විකල්පයක් ලෙස යුරෝපය සමාජවාදී පදනම මත එක්සත් කිරීමට අපි උත්සාහ කරමු.''

පක්ෂයේ යුරෝපීය මැතිවරන ප්‍රකාශනයෙන් උපුටාගත් මෙම කොටස සමගින් ම පීටර් ෂ්වාට්ස් - පීඑස්ජී විධායක කොමිටියේ හා ලෝ.ස.වෙ.අ. කර්තෘ මන්ඩලයේ සමාජික, ජර්මනියේ සමාජවාදී සමානතා පක්ෂය (පී.එස්.ජී) මගින් පැවැත් වූ අවසාන මැතිවරන රැස්වීම ඇරඹුවේ ය.

පසුගිය සෙනසුරාදා බර්ලින් හි පැවැත් වූ මෙම රැස්වීම අතිසාර්ථක මැතිවරන ව්‍යාපාරයක උච්චතම අවස්ථාව විය. පසුගිය සති කිහිපයේ දී පක්ෂයේ ආධාරකරුවන් මැතිවරන ප්‍රකාශනයේ පිටපත් දහස් ගනනක් ජර්මනිය පුරා බෙදා හැර තිබුනි. විශ්වවිද්‍යාලවල දී, රැකියා හුවමාරු මධ්‍යස්ථානවල දී හා බර්ලින්, බොකම්, ලීප්සිග්, ෆ්‍රැන්ක්ෆර්ට්, හැම්බර්ග් රැස්වීම්වල දී නොගිනිය හැකි තරම් සාකච්ඡා කම්කරුවන් හා ශිෂ්‍යයින් සමග පැවැත්විය.

ප්‍රචාරන ව්‍යාපාරයේ මූලික අරමුන වූයේ අර්බුදයේ නියම පරිමානයේත් සමාජවාදී ඉදිරි දර්ශනයකට ඇති අත්‍යාවශ්‍යතාවයේත් තරමට කම්කරුවන් සූදානම් කිරීමයි. ''අපගේ වැඩසටහනේ කර්තව්‍යයන්ට, මේ කුමක් ද යන්න කීමත්, ඡන්ද දායකයින්ට විවෘතව කතා කරමින් ඔවුන් යථාර්ථයට අභිමුඛ කිරීමත් ඇතුලත් අපගේ වැඩසටහන අතීතය කරා නොව අනාගතය කරා එල්ල වූවකි. වාම පක්ෂය කරන ආකාරයෙන් - අපි සමාජ ප්‍රතිසංස්කරනවාදයේ ස්වර්නමය යුගය කරා නැවත යා හැකියි පොරොන්දු නොවෙමු. ඒ වෙනුවට අපි කම්කරුවන් අනිවාර්ය පන්ති සටන් සඳහා සූදානම් කරමු'' යි බර්ලින් රැස්වීම අමතමින් ෂ්වාට්ස් පැවසීය.

දෙවන ලෝක යුද්ධයේ අවසානයේ පටන් ම අප නිරන්තරයෙන්ම ලෝක ධනවාදයේ වර්ධනයන් විශ්ලේෂනය කල හෙයින් මෙම වර්තමාන අර්බුදයෙන් හතරවැනි ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව පුදුමයට පත්වූයේ නැතැයි ෂ්වාට්ස් ප්‍රකාශ කලේ ය. වසර 20 කට පෙර ස්ටැලින්වාදය බිඳ වැටීමෙන් පසු "ස්ටැලින්වාදී තන්ත්‍රයන් ඇදවැටීමේ මුවවිටට ගෙන ආ මේ ලෝක ආර්ථිකය හා ජාතික රාජ්‍ය අතර පරස්පරය ම ලෝක ධනවාදයේ අර්බුදය ද තීව්‍ර කරනු ඇති" බව හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව තීන්දු කලේය.

"ප්‍රමුඛ පෙලේ නිලධාරිවාදී යාන්ත්‍රන මගින්, පන්ති භේද ග්‍රහනය කර ගෙන උරාගැනීමට හැකි වූ කාල වකවානුව අවසන් බව" තවදුරටත් ඔහු පැවසීය.

මේ හේතුව නිසා වාම පක්ෂයෙන් හෝ පැරනි නිලධාරී තන්ත්‍රික යාන්ත්‍රනයෙන් ඉතිරි වී ඇති වෙන මොනම කොටසකින් හෝ සහනයක් ලබා ගැනීමට අපි බලාපොරොත්තු නොවුනෙමු. සෝවියට් දේශයේ බිඳ වැටීමෙන් පසු මෙවන් ඉදිරි දැක්මකට කිසිදු අර්ථයක් නොමැතිව ගොස් ඇතියි පැවසූ සියල්ලන්ට විරුද්ධව අපි මාක්ස්වාදී උරුමය - මාක්ස්, එංගල්ස්, රෝසා ලක්සම්බර්ග්, ලෙනින් හා ට්‍රොට්ස්කි විසින් ආරක්ෂා කරන ලද විප්ලවවදී සම්ප්‍රදායයන් - ආරක්ෂා කල අතර ම තව දුරටත් වර්ධනය කලෙමු"යි ෂ්වාට්ස් පැවසීය.

පීඑස්ජී ය එහි මැතිවරන ව්‍යාපාරයේ දී හිතාමතාම යුරෝපය ම අලලා ගැනීමක් හා ජාත්‍යන්තර නැඹුරුවක් යොදා ගත්තේ ඇයි දැයි පීඑස්ජී විධායක කමිටුවේ සමාජිකයෙකු වන ක්‍රිස්ටෝෆ් වැන්ඩ්‍රියර් ඔහුගේ කථාවේ දී පැහැදිලි කලේය. වර්තමාන අර්බුදයේ ජාත්‍යන්තර ස්වභාවය ඔහු අවධාරනය කරනු ලැබුවේ ඒකාබද්ධ සටනක් සංවිධානය කිරීමේ

අත්‍යාවශ්‍යකභාවය හා ශක්‍යතාව පෙන්වා දෙමිනි. ඊට අමතරව තනිරටවල කම්කරුවන්ගේ අත්දැකීම් මුලුමහත් ජාත්‍යන්තර කම්කරු පන්තිය සමග ම බෙදා හදා ගැනීම අත්‍යාවශ්‍ය වූ බව ඔහු පැවසුවේ ය.

ඔහු පෝලන්තය පිලිබඳ උදාහරනය ගෙනහැරපාමින් නැගෙනහිර යුරෝපයේදී යුරෝපීය කම්කරු පන්තිය මුහුන දෙන උග්‍ර ගැටලු පෙන්වා දුන්නේ ය. යුරෝපයේ විශාලතම "කම්කරු" ව්‍යාපාරයට 1980 ගනන්වල මූලාරම්භය වූයේ පෝලන්තයයි. ස්ටැලින්වාදී තන්ත්‍රයට එරෙහි සටනේ දී පෝලන්ත කම්කරුවන්, එක් අවස්ථාවක එහි සමාජිකත්වය මිලියන 10 ක් තරම් වූ සොලිඩැනොසැක් වෘත්තීය සමිතිය පිහිටුවා ගත්හ. ඒ කෙසේ වුවත්, ස්ටැලින්වාදී තන්ත්‍රය කඩා වැටීමෙන් පසු විශාල වශයෙන් වැඩ නොලැබී යාම් හා සමාජ සුභසාධන සුනුවිසුනු කරලීම් සංවිධානය කරමින් හා ඒවා සඳහා අවස්ථාව සලසමින් හරියටම මෙම වෘත්තීය සමිතිය ම පෝලන්තයට නැවත ධනවාදය හඳුන්වාදීම සංවිධානය කිරීම ගැන කම්කරුවන් සාක්ෂි දැරිය.

වැන්ඩ්‍රියර්, මැතිවරන ව්‍යාපාරය තුලදී සංචාරයක යෙදුන, ඩැන්ස්ක් හි කම්කරුවන්ගේ ඉරනම එනයින් ගත් කල උචිත උදාහරනයක් වේ. 1980 ගනන්වල දී ස්ටැලින්වාදීන්ට එරෙහිව දසදහස් ගනනක් විරෝධතා දක්වා තිබුනි. වසර 30 කට පමන පසු දැන් නෞකාංගන කම්කරුවන් ඉතිරිව සිටින්නේ 3,000 ක් පමනි. මේ කම්කරුවන්ට ද පෙනී යමින් ඇත්තේ ඊලඟ මාස කිහිපය තුලදී නැව්අංගන සම්පූර්නයෙන්ම වසා දමා ඔවුන් හට වැඩ නොමැතිව යනු ඇති බවයි.

පෝලන්ත කම්කරුවන් ධනපතික්‍රමය පුනස්ථාපනය කිරීමට සටන් නොවැදුන මුත් ඔවුන් "සමාජවාදී ඉදිරිදර්ශනයකින් හා ස්ටැලින්වාදය පිලිබඳ මාක්ස්වාදී විශ්ලේෂනයකින්" තොර වු බව වැන්ඩ්‍රියර් ප්‍රකාශ කලේ ය. "දේශපාලන විප්ලවයේ ඉදිරිදර්ශනය දක්නට නොවීය."

දැන් ප්‍රශ්නය වූයේ මේ ඓතිහාසික පාඩම් කම්කරුවන් හා අභිමුඛ කිරීම යයි ඔහු තවදුරටත් පැවසීය. ඔවුන්ට ජාත්‍යන්තරවාදී ඉදිරිදර්ශනයක් කරා නැඹුරුවන්නට තිබිනි. හතරවන ජාත්‍යන්තරයේ පෝලන්ත ශාඛාවක් ගොඩනැගීමට සූදානම් වීමේ ප්‍රධානතම කර්තව්‍යය වූයේ එයයි.

සපුරාම වෙනස් පිලිවෙතක් ඉදිරියට දමාගෙන ඇති ප්‍රන්සයේ නව ධනපති - විරෝධී පක්ෂයේ (එන් පී ඒ) භූමිකාව කරා ඔහු ඉන්පසුව යොමු විය. ඔවුන් පෝලන්තයේ තම මිත්‍ර පාර්ශවය ලෙස ප්‍රකාශ කර ඇති පක්ෂය වන්නේ පෝලන්ත කම්කරු පන්තිය යි (පීපීපී). එන්පීඒ නායක ඕලිවියර් බෙසැන්සිනොව් සහභාගී වූ මැතදී පැවැත්වූ පිපීපී යේ යුරෝපීය මැතිවරන සම්මේලනයේ දී නියෝජිතයින් විවෘතව ම ජාතිකවාදයේ අන්ත පසුගාමීත්වය වපුරාලූහ.

බෙසැන්සිනොව්, පීපීපී නියෝජිතයින්ගේ එවන් ජාතිකවාදී මනෝගතීන් සම්බන්ධයෙන් වත් එසේත් නැතිනම් සොලිඩැර්නොස්ක් වර්නනා කිරීම සම්බන්ධයෙන් වත් කිසිදු විවේචනයක් සිදු නොකලේ ය. සම්මේලනයට ඔහු ම කල ප්‍රතිපදානයේ දී වත් පසුගිය දශක තුන තුල සොලිඩැර්නෙස්ක් සිදුකල ඓතිහාසික හෝ දේශපාලන පාවාදීම් සිහිකැඳවූයේ වත් නැත. එහි ආරම්භක සම්මේලනයේ දී ට්‍රොට්ස්කිවාදයට අනුගත වීමේ කිසියම් ම හෝ සලකුනක් තුරන් කර දමා තිබුනි. දැන් ජාතිකවාදීන් විසින් වට කරනු ලැබුව බෙසැන්සිනොව් සමාජවාදය පිලිබඳ යත්තමින් හෝ සඳහන් කිරීමෙන් වැලකී සිටියේ ය.

එන්පීඒ ය විප්ලවවාදී සංවිධානයක් නොව, එනමුත් ධනවාදයේ ආරක්ෂාව සඳහා සිටින අවසන් පෙල ගැසුම යයි වැන්ඩ්‍රියර් බැරෑරුම්ව පැවසී ය.

පීඑස්ජී යේ විධායක කමිටුවේ සමාජික කේ නේසන් ශ්‍රී ලංකාවේ මෑත කාලීන සිද්ධීන් පිලිබඳව කථා කලේ ය. "රටේ කම්කරු පන්තියට, එල්ටීටීඊයට එරෙහි යුද්ධයේ අවසානය සැමරීමට කිසිදු හේතුවක් නැත. එයින් මත්තෙහි ඔවුන් හමුවේ ඇති කිසි ම ප්‍රශ්නයක් නොවිසඳෙන අතර රජය, ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හා ජීවන කොන්දේසි මත නවතම ප්‍රහාර සැලසුම් කරමින් සිටියි." ඔහු පැවසීය.

දහස් ගනන් සිවිල් අනතුරු ද එසේ ම පලපුරුදු සහන සංවිධාන ඔවුන් දැක ඇති නරකම ජීවන කොන්දේසි ලෙසින් පැහැදිලි කරනු ලබන 300,000 ක් සරනාගතයින් ගැන ද කථිකයා වාර්තා කලේය.

© www.wsws.org

එලඹෙමින් ඇති බංකොලොත් වීමෙන් ශ්‍රී ලංකා රජය රැක ගැනීම සඳහා යුද්ධයේත් ජාත්‍යන්තර ආර්ථික අර්බුදයේත් බර පැන කම්කරු පන්තිය විසින් දරනු ලැබෙනවා ඇති බව කේ නේසන් පෙන්වා දුන්නේය.

ජාත්‍යන්තර මහා බලවතුන් අතර තීව්‍ර වන ඝට්ටනවල පොර පිටියක් ලෙස ශ්‍රී ලංකාව යොදවා ගනිමින් සිටින ආකාරය ඔහු විස්තර කලේ ය. මහා බ්‍රිතාන්‍යයත් ප්‍රන්සයත් ශ්‍රී ලංකාවේ යුද අපරාධ පිලිබඳව පරීක්ෂනයක් ඉල්ලා සිටින විට චීනය, රුසියාව හා ඉන්දියාව එවන් පරීක්ෂනයක් ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර කටයුතුවලට අතපෙවීමක් සේ සලකා ප්‍රතික්ෂේප කලහ. ඒ කෙසේ වෙතත් ශ්‍රී ලංකාව තුල සිදුවන වර්ධනයන් තුලින් සටහන් කර ගත යුතු ඉතා ම වැදගත් පාඩම නම් දෙමල විමුක්තිකාමී සංවිධානය, එල්ටීටීඊය, එලඹගත් ඉදිරිදර්ශනයේ බංකොලොත් භාවයයි.

"ශ්‍රී ලංකා හමුදාව හැම අතින්ම එල්ටීටීඊයට වඩා මිලිටරිමය වශයෙන් ප්‍රබලය. යුද්ධයේ අවසන්

අදියරේ දී ඔවුන් සිය ගනනක් සටන්කරුවන්ගේ කෲර සමූල ඝාතනයක් සංවිධානය කලහ. එසේ වුවද පරාජයේ නියම හේතුව සොයාගත හැක්කේ එල්ටීටීඊයේ පටු වර්ගවාදී නැඹුරුවකින් යුත් ඉදිරිදර්ශනය තුල වේ."

මේ ඉදිරිදර්ශනයේ පදනම වූයේ එල්ටීටීඊයේ සමාජ දිශානතියයි. "ඔවුන්ගේ ආරම්භක ප්‍රකාශනයේ දී එල්ටීටීඊය සමාජවාදය කුහක ලෙස ඇඳා ගත්ත ද එය ඓතිහාසිකව ඔවුන්ගේ ම ජනතාව සූරාකෑමේ අයිතිය ඉල්ලා සිටි දෙමල ප්‍රභූ පැලැන්තියේ අවශ්‍යතාවයන් නියෝජනය කලහ."

කම්කරු පන්තිය වෙත එල්ටීටීඊයේ ඇති වෛරය, *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ජාත්‍යන්තරව ගෙන ගිය අරගලයකින් පසුව පමනක් නිදහස් කරනු ලැබූ ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ සමාජිකයින් පැහැර ගැනීමෙන් පසු 1998 දී මොනවට පැහැදිලි විය.

ශ්‍රී ලංකාවේ වසර 26 ක් දිගු යුද්ධයේත් එල්ටීටීඊ ප්‍රතිපත්තියේත් අත්දැකීම් පහත ආකාරයෙන් කේ නේසන් සාරාංශ ගත කලේ ය; "එල්ටීටීඊයේ පරාජය දෙමල සුලුතරයේ ප්‍රජාතන්ත්‍රික ඉල්ලීම් අවලංගු නොකරයි. කෙසේ වෙතත් එය පැහැදිලි කර දෙන්නේ එවන් ප්‍රජාතන්ත්‍රික අයිතීන් දිනාගත හැකි වන්නේ ජාත්‍යන්තරවාදී වැඩපිලිවෙලක් මත පදනම් වූ සමාජවාදී විප්ලවයකින් පමනක් බවයි."

රැලියේ අවසන් කතිකයා වූයේ පීඑස්ජී සභාපති හා යුරෝපීය මැතිවරනයේ ප්‍රධාන අපේක්ෂක උල්රිච් රිපර්ට් ය. ඔහුගේ ප්‍රතිපදානය, "නව සමාජවාදී පක්ෂයක් ගොඩනැගීම අත්‍යාවශ්‍ය වන්නේ ඇයි, එසේ ම පීඑස්ජීය මේ නව පක්ෂය වන්නේ ඇයි? යන ප්‍රශ්නය වෙනුවෙන් වෙන් කලේ ය.

මේ ප්‍රශ්නය අවබෝධ කරගැනීම සඳහා වර්තමාන ආර්ථික ඇදවැටීමේ සමාජ, දේශපාලන ප්‍රතිවිපාක හැකි තරම් සංයුක්ත ලෙස විමර්ශනය කිරීමත් සමාජවාදී ව්‍යාපාරයේ ඉතිහාසය අධ්‍යනය කිරීමත් අත්‍යාවශ්‍යය වන බව රිපර්ට් අවධාරනය කලේ ය.

රිපර්ට්, පසුගිය අඩ වසරේ දී නිෂ්පාදනය සියයට 12 කින් ක්ෂය වීම හා වෙලඳාම සියයට 16 කින් පහත වැටීම, එසේම විරැකියාව ලෝක පරිමානව මිලියන 190 කට ඉහල යාම වැනි අර්බුදයේ ප්‍රතිවිපාක සැලකිය යුතු ප්‍රමානයක් ගෙන හැර පෑවේ ය. "මේ අර්බුදය, නොමග යාමක්, එසේ නොවූ කල එලදායී හා ක්‍රියාවෙහි යෙදවිය හැකි ධනපති ක්‍රමයේ අක්‍රමවත් ක්‍රියාවක් හෝ නොව, නමුත් ඊට පටහැනිව එය මෙම පද්ධතියේ ඓතිහාසික පරිහානියේ අනිවාරනීය ප්‍රතිඵලය වන්නේ යයි" රිපර්ට් වැඩි දුරටත් පැවසී ය.

මේ අර්බුදයට "ධනවාදයේ ප්‍රතිවිරෝධයන් තුල ගැඹුරට ඇදුන ව්‍යෛශයික හේතූන්" ඇති බව ඔහු අවධාරනය කලේ ය. "මෙය විශේෂයෙන්ම සැලකූ විට, ජාතික රාජ්‍ය සමග වෙන් නොකල හැකි ලෙස සම්බන්ධ වී පවතින ජාත්‍යන්තර ශ්‍රම විභජනයක් හා බැඳුනු සමාජයීය නිෂ්පාදනය හා පෞද්ගලික භුක්තිය අතර ප්‍රතිවිරෝධයයි."

පන්ති අරගලය ව්‍යෛශයික සමාජයීය ආතතීන් මත පදනම් වේ. අනුක්‍රමයෙන් රාජ්‍යයන් නොයෙක් ආකාරයේ ගලවා ගැනීමේ පැකේජ වල මුහුනුවර පෙන්වමින් සත්‍ය තත්වයේ දී රාජ්‍ය භාන්ඩාගාර බැංකු වෙත හරවා ඇති ආකාරය රිපර්ට් සිහිපත් කලේ ය. එසේ කරද්දී ම, ලෝකය පුරාම වැටුප් කප්පාදු කිරීම සඳහා මහජන විරැකියාව දඩමීමා කරගනිමින් සිටින අතර සුභසාධක රාජ්‍ය ප්‍රතිපත්තිවලට ද වල කපති.

මේ ප්‍රහාරයන් කම්කරු පන්තියෙන් ප්‍රතික්‍රියාවක් හා ප්‍රතිරෝධයක් පොලඹවනු ඇති බවට සැකයක් තිබිය නොහැක. කම්කරු පන්තිය තුල දක්නට ලැබෙන නිසල බව අශුභවාදී නිගමන සඳහා හේතු නොසපයයි. එය "කුනාටුවකට පෙර ඇති වන සන්සුන් බව" යයි ඔහු පැවසී ය.

"එලඹෙන සමාජ පිපිරීම ප්‍රගතිශීලී, සමාජවාදී දිශානතියක ගමන් කරවිය හැකි දේශපාලන උපකරනය" තනනු වස් මේ කාලය යොදා ගැනීම අනිවාර්ය විය.

20 වන සියවසේ කම්කරු ව්‍යාපාරයේ අත්දැකීම් වලින් ඉගෙනගත යුතු යයි පැමින සිටින්නන්ගෙන් රිපර්ට් ඉල්ලා සිටියේ ය; "එස්පීඩී හා කේපීඩී රූපාකාරයන් දැනටමත් මහජන පක්ෂ දෙකක් ගොඩනගා ඇති ජර්මනියේ දී විශේෂයෙන්ම මෙම සංවිධාන දෙකෙහි නැගී ඒම හා කඩා වැටීම තුලින් පාඩම් උකහා ගැනීම තීරනාත්මකව වැදගත් වේ."

අවසන් වශයෙන් කථිකයා පීඑස්ජී වැඩපිලිවෙලෙහි ප්‍රධාන කරුනු; ජාත්‍යන්තරවාදය, සමාජයේ සමාජවාදී පරිවර්තනය සඳහා අරගලය හා කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය සඳහා සටන පිලිබඳ පැහැදිලි කලේ ය.

මේ වැඩ සටහන, පීඑස්ජීය එහි මැතිවරන ව්‍යාපාරයේ දී "තමන් ම ධනපති - විරෝධී වමාංශය යයි විස්තර කර ගන්නා වාම පක්ෂය හා අනෙකුත් කල්ලිගැසීම් වලට ඉතා දැනුවත්ව විරුද්ධ වීම" ඉල්ලා සිටී.

මෙම වාම පක්ෂ හා කල්ලිවල සමාජයීය කර්තව්‍යය රිපර්ට් පහත පරිදි පැහැදිලි කලේ ය; " ජර්මනියේ වාම පක්ෂය, ප්‍රන්සයේ මෙලෙන්චොන්ස් පිහිටුවීම, ඉතාලියේ කොමියුනිස්ට් නැවත පිහිටුවා ගැනීම, ග්‍රීසියේ සිරියා එසේම ප්‍රන්සයේ එන්පීඒ, පාලක පන්තියේ දේශපාලන මුලපිරීම් වන අතර ඉතා ආසන්න

පන්ති අරගලයට ඔවුන්ගේ පැත්තෙන් කරන සූදානම් වීමේ කොටසකි."

පසුගිය වසරේ අග ග්‍රීසියේ තරුන විරෝධතාවල තීව්‍රතාවය බොහෝ සෙයින් අභිබවන විප්ලවාදී අරගලවලට මේ ආර්ථික හා සමාජ අර්බුදය මග පෙන්වනු ඇති බවට ධනපති පන්තිය හොඳින් සවිඥානකය. ඔවුන් ආකාර දෙකකින් - "සියලුම රටවල රාජ්‍ය හා පොලිස් අධීක්ෂන මගින් ප්‍රජාතන්ත්‍රික අයිතීන් සීමා කරන අතරවාරයේ ම ජාතිකවාදී හා වර්ගවාදී ප්‍රවනතාවයන්ට උල්පන්දන් දීම - තමන් ම සමාජවාදී යයි හෝ ධනපති - විරෝධී යයි කියා ගන්නා වාමවාදී පක්ෂ ද එක්ව ක්‍රියාකිරීමේ දී, ධනපති පාලනයට තර්ජනයක් විය හැකි විප්ලවවාදී අරගලවලට වැට බඳින වෘත්තීය සමිති ද පෝෂනය කිරීම- සූදානම් වේ.

ඔහුගේ කථාව අවසන් කරමින් මතු කල කරුනුවල දී, ඕනෑම ජාතිකව පදනම් වූ ඉදිරිදර්ශනයකට ඇති පදනම නිෂ්පාදනයේ භූගෝලීයකරනය විසින් ඉරා විසිකර ඇතැයි රිපර්ට් පැහැදිලි කලේ ය. "පැරනි කම්කරුවන්ගේ සම්පූර්න ව්‍යාපාරය ම කඩා වැටීම පසුපස ඇත්තේ මෙයයි. ඊට අමතරව භූගෝලීයකරනය, සාමූහිකත්වය මත පදනම් වු අභිනව, නවීන සමාජයක් වර්ධනය කර ගැනීම සඳහා ජාත්‍යන්තර පන්තියක් සේ කටයුතු කිරීමට කම්කරු පන්තිය විසින් හදාරනු ලබන සමාජ වර්ධනයේ නව ගුනාත්මක වර්ධනයක් හඳුන්වා දුන්නේ ය. අපගේ නිසැක බවත් ශුභවාදී බවත් මෙම වෛෂයික වර්ධනය මත රැඳී ඇත."

රැස්වීම තුලදී මහා බ්‍රිතානයෙන්, ප්‍රන්සයෙන් හා ඉතාලියෙන් එවූ සුභපැතුම් පනිවිඩ කියවනු ලැබී ය.

රැස්වීම අවසානයේ පීඑස්ජී ව්‍යාපාරයේ අරමුදලට යූරෝ 4,000 කට වැඩි ප්‍රමානයක් එකතු විය.

සහභාගීව සිටි 100ක් පමන දෙනා කථිකයන්ගේ ප්‍රතිපදාන ඉතා සාවධානයෙන් අසා සිටියහ. මෙම රැස්වීම පීඑස්ජී ව්‍යාපාරය කම්කරුවන් හා තරුනයින්ගේ ඉතා වැදගත් කොටසක් අතරින් සැලකිය යුතු තරමේ ප්‍රතිචාරයක් දිනාගෙන ඇති බව පෙන්නුම් කලේ ය.

© www.wsws.org